ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

කුසලතා කැප්ස්ටෝනය - ජූලි 2016

## (SS2) තොරතුරු තාක්ෂණ කුසලතා

(Information Technology Skills)

---

කාර්යාලයීය මෘදුකාංග යෙදවුම් කෙරෙහි වඩාත් සැලකිලිමත් වෙමින් කාර්යාල පරිසරය තුළ තොරතුරු තාක්ෂණ කුසලතා යෙදවීම පිළිබඳ අයදුම්කරුවන්ගේ තොරතුරු තාක්ෂණයේ සමස්ථ දැනුම හා කුසලතා මෙම ප්‍රශ්න පත්‍රයෙන් පරීක්ෂාවට ලක්කරන ලදී. සාර්ථක ආකාරයෙන් මෙම ප්‍රශ්න පත්‍රයට උත්තර දීම සඳහා, කාර්යාලයීය පරිසරයක් තුළ තොරතුරු තාක්ෂණ භාවිත යෙදුම් පිළිබඳ ප්‍රායෝගික දැනුම අත්‍යවශ්‍ය බව සටහන් කළ යුතුය.

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න විස්සකි (20)

(මුළු ලකුණු 40)

## ප්‍රශ්න අංක 01

තේරුම්ගත හැකි අන්දමින් මූලික තොරතුරු තාක්ෂණ දැනුම පරීක්ෂාවට ලක්කර තිබේ. අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර කාර්යසාධනය සතුටුදායක විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය නවතම තාක්ෂණය මත පදනම් වූ ප්‍රශ්න වලට නිවැරදි උත්තර සපයා තිබුණි. මෙම ප්‍රශ්නයට වැඩි ලකුණු ලබා ගැනීම බෙහෙවින් අවශ්‍යයය. සමස්ථ වශයෙන් ඉහළ ලකුණු ලබා ගැනීම සඳහා විෂය නිර්දේශය පිළිබඳ සමස්ථ දැනුමක් අවශ්‍යයය.

A කොටසේ අනෙකුත් අනු ප්‍රශ්න සමඟ සසඳා බැලීමේදී බොහෝ අයදුම්කරුවන් අංක 1.9 සහ 1.10 අනු ප්‍රශ්න වලට වැරදි උත්තර සපයා තිබූ බව නිරීක්ෂණය විය. අනු ප්‍රශ්න අංක 1.9 සඳහා උත්තරය වශයෙන් අංක (3) "2013 මයික්‍රොසොෆ්ට් ඔෆිස් මෘදුකාංගය ඔබේ කාර්යාල මේසය මත ඇති පරිගණකයෙහි යාවත්කාලීන කිරීම" ආචාර ධර්මානුකූලව පිළිගතහැකි කාර්යයක යෙදී සිටින්නේයැයි ලෙස තෝරා ගැනීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය.

අනු ප්‍රශ්න 1.10 සඳහා උත්තරය, 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත බව අයදුම්කරුවන්ගෙන් බහුතරය දැන සිටියේ නැත. තොරතුරු තාක්ෂණයේ ආචාරධර්මානුකූල සහ නෛතික පසුබිම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය.

සමහර අයදුම්කරුවන් අංක 1.1 සිට 1.10 දක්වා අනු ප්‍රශ්න වලදී ඔවුන් තෝරාගත් උත්තරයේ අංකය වෙනුවට සම්පූර්ණ උත්තරය ලියා තිබුණි. මෙය වටිනාකමක් නොලැබෙන කාලය මිඩංගු වන ව්‍යායාමයකි. තවද, අනු ප්‍රශ්න 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්න වල නියම කර ඇති "සත්‍යය" හෝ "අසත්‍ය" යන්න සඳහන් කිරීම වෙනුවට සමහර අයදුම්කරුවන් "√" හෝ "x" ලකුණු කර තිබුණි.

A කොටසේ වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න වලට උත්තර ලිවීමේදී දී ඇති උපදෙස් කියවා බලා තේරුම් ගැනීම වැදගත් වේ.

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 60)

*එකකට ලකුණු 15 බැගින් වූ ප්‍රශ්න හයකින් B කොටස සමන්විත වූ අතර, ඕනෑම ප්‍රශ්න හතරකට උත්තර ලිවීමේ නිදහස අයදුම්කරුවන් හට ලබාදී තිබුණි.*

### ප්‍රශ්න අංක 02

දත්ත පදනම් ආශ්‍රිත දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නයකි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු ප්‍රශ්නයට උත්තර ලියා ඇති අතර (a) සහ (b) කොටස් සඳහා හොඳින් ලකුණු උපයාගෙන තිබුණි. බොහෝ දෙනෙකුට හොඳ මට්ටමේ අවබෝධයක් තිබූ අතර ගැලපෙන සේ උත්තර ලියා ලකුණු 10 පහසුවෙන් ලබා ඇත. එහෙත් (c) සහ (d) කොටස් සඳහා උත්තර සතුටුදායක නැත. (b) කොටසේ වඩාත් සුදුසු දත්ත වර්ගය හඳුනා දැක්වීමේදී අයදුම්කරුවන් කිප දෙනෙකු text (අකුරු, ඉලක්කම්, සංකේත ආදිය) වෙනුවට "නම" හා currency (මුදල / ව්‍යවහාර මුදල) වෙනුවට "රු" හෝ "විකුණුම් මිල" යන වැරදි උත්තර ලියා තිබුණි. බොහෝ අයදුම්කරුවන් (d) කොටස වරදවා වටහාගෙන ඇත. වාර්තාව නිර්මාණය කිරීම පිණිස අදාල වන ක්‍රියා පටිපාටිය පැහැදිලි කිරීම අපේක්ෂා කර තිබුණද දත්ත පදනම නිර්මාණය කර දත්ත පිරවීම පිළිබඳව ඔවුන් ලියා ඇත.

මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ථ කාර්යසාධනය සතුටුදායක විය. මෙබඳු ප්‍රශ්න සඳහා ඉහළ ලකුණු ලබා ගැනීම පිණිස දත්ත පදනම් වලට අදාල සංකල්ප සහ ප්‍රායෝගික භාවිතය අයදුම්කරුවන් වටහා ගත යුතුය.

### ප්‍රශ්න අංක 03

පවර්පොයින්ට් මෘදුකාංග භාවිත කරමින් ඉදිරිපත් කිරීමක් නිර්මාණය කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් අඩු සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නය තෝරාගෙන උත්තර සපයා තිබුණි. ඔවුන් අතුරෙන් බොහෝ දෙනෙකු නිවැරදිව උත්තර ලියා ඇතත්, නියම අංග යොමු දැක්වීමට සහ ඒවා විස්තර කිරීමට දැනගැනීමේ ඉඟි වචන (key words) දීමට අපොහොසත් වී ඇත.

මෙබඳු ප්‍රශ්නයක් සඳහා උත්තර සැපයීමට ප්‍රමාණවත් දැනුමක් තොරතුරු තාක්ෂණ යෙදවුම් වලට යොමු වෙමින් අධ්‍යයනය කිරීමෙන් පමණක් ලබා ගත නොහැකි අතර, ඒවා ප්‍රායෝගිකව කිරීමෙන් ලබන අත්දැකීම් අවශ්‍ය වනු ඇත.

### ප්‍රශ්න අංක 04

පැතුරුම් පත්‍රිකා යෙදවුමකදී සූත්‍ර / ශ්‍රිත යොදාගැනීමේ හැකියාව පරීක්ෂා කරන ප්‍රශ්නයකි. අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් පමණක් මෙම ප්‍රශ්නය තෝරා, උත්තර ලියා ඇත. ඍජු උත්තර අපේක්ෂා කළ තැන් වලදී ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු උත්තර සැපයීමට අපොහොසත් වී තිබේ. පැතුරුම්පත් පිළිබඳ මෙබඳු ප්‍රශ්න වලට විශ්වාස සහගතව උත්තර ලිවීමට ඔවුන් වැඩියෙන් හුරුවීම අත්‍යවශ්‍යය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය අදාල යොමු (relative references) හා නියත යොමු (absolute references) අතර වෙනස නොසලකා හැර තිබේ.

අයදුම්කරුවන්ගෙන් අතලොස්සක් පමණක් මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු උපයා ඇත.

## ප්‍රශ්න අංක 05

අන්තර්ජාලය සහ බැංකු කටයුතු සඳහා එය යොදාගැනීම පිළිබඳ දැනුම පරීක්ෂා කළ ප්‍රශ්නයකි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට තෝරාගෙන තිබුණි.

උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය. අයදුම්කරුවන් බොහොමයක් (b) සහ (c) කොටස් සඳහා නිවැරදිව උත්තර ලියා ඇත. එහෙත් අයදුම්කරුවන් බොහෝ දෙනෙකු (a) කොටස වරදවා වටහාගෙන තිබුණි. අන්තර්ජාල සේවා සපයන්නෙකු සමග සම්බන්ධ කිරීමට භාවිත කළ හැකි සම්බන්ධක තාක්ෂණයන් විමසා තිබේ. ඔවුන්ගෙන් බෙහෝ දෙනෙකු සඳහන් කර ඇත්තේ සම්බන්ධ කරන උපාංග ගැන මිස සම්බන්ධක තාක්ෂණයන් ගැන නොවේ. සමහර අයදුම්කරුවන් (c) කොටසේ දක්වා ඇති අන්තර්ජාල බැංකු පද්ධති, හුදු ණය කාඩ්පත් (credit cards) භාවිතය සමග පටලවාගෙන තිබුණි.

අයදුම්කරුවන් උත්තර ලිවීම ආරම්භ කිරීමට ප්‍රථම ප්‍රවේශමෙන් ප්‍රශ්නය කියවා අවබෝධ කරගත යුතුය. නූතන ව්‍යාපාරික පරිසරය තුළ පොදු භාවිතයේ යෙදී ඇති බැවින් අන්තර්ජාල බැංකු පද්ධති වැනි දෑ පිළිබඳව කියවා බලා හෝ නව තාක්ෂණයේ දියුණුවීම් ගැන අයදුම්කරුවන් ඉගෙන ගත යුතුය.

## ප්‍රශ්න අංක 06

අන්තර්ජාලය හරහා ගොනු බැරකිරීම සහ විද්‍යුත් තැපැල භාවිතය පිළිබඳ මූලික කරුණු ගැන දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නයකි. විකල්ප ප්‍රශ්න අතුරෙන් වඩාත්ම මනාපය පල කර තිබුණේ මෙම ප්‍රශ්නයටය. අයදුම්කරුවන් වෙත යොමු වූ අගය කළ හැකි ප්‍රමිතියක් සහිත ප්‍රශ්නයක් වූවා මෙන්ම හොඳ උත්තර ලිවීමේ කාර්යසාධනයක් ඔවුන්ගෙන් ලැබුණ ප්‍රශ්නයක් විය. කෙසේවුවත්, අයදුම්කරුවන් කීප දෙනෙකු (d)(ii) කොටස වරදවා වටහාගෙන තිබූ බව පෙනී ගියේය. එම අයදුම්කරුවන් දත්ත වර්ග යන්න දත්තවල ස්වරූපය සමග පටලවාගෙන තිබුණි.

අයදුම්කරුවන්ගෙන් බහුතරය ඉහළ ලකුණු ලබා තිබූ අතර උත්තර ලිවීමේ කාර්යසාධනය ඉතාමත් සතුටුදායකය.

## ප්‍රශ්න අංක 07

මයික්‍රොසොෆ්ට් වර්ඩ් හි තෝරාගත් අංග වලින් ඉටු කරනු ලබන කාර්යය පැහැදිලි කිරීම සඳහා කෙටිසටහන් ලිවීම මගින් පද සැකසීමේ මෘදුකාංග පිළිබඳ දැනුම පරීක්ෂා කරන ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් හරි අඩක් පමණ මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබුණේය. ඔවුන් අතුරෙන් සියලු දෙනාම වාගේ (a) සහ (b) කොටස් සඳහා නිවැරදිව උත්තර ලියා ඇත. එහෙත් (c) (d) හා (e) කොටස් සඳහා නිවැරදිව උත්තර ලියා තිබුණේ කීප දෙනෙකු පමණි.

සමහර අයදුම්කරුවන් අදාල නොවන දීර්ඝ උත්තර ලියා තිබුණේය. සාමාන්‍ය දැනීම ආශ්‍රයෙන් ඔවුන් උත්තර ලිවීමට උත්සාහ කර තිබේ. අවබෝධ කර නොගැනීම හඟවන්නේ ප්‍රායෝගික භාවිතයට අවස්ථා නොතිබීම යන්නය. ඉහළ ලකුණු ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් මෙබඳු මූලික පද සැකසීමේ අංග පුරුදු පුහුණු වීමට කාලය මිඩංගු කළ යුතුය.

අයදුම්කරුවන් කීප දෙනෙකු පමණක් මෙම ප්‍රශ්නය සඳහා ඉහළ ලකුණු ලබා ගැනීමට සමත් විය.

## පොදු නිරීක්ෂණ

- අයදුම්කරුවන්ගෙන් කිප දෙනෙකු උත්තර සඳහා අංක යොදනවා වෙනුවට උත්තර පොත් අංක යොදා තිබුණි. ප්‍රශ්න අංකය යෙදීම සඳහා වෙන්කර ඇති ඉඩකඩෙහි ඔවුන් පිටු අංකය යොදා තිබුණි.

- තොරතුරු තාක්ෂණයේ ප්‍රායෝගික පැතිකඩ පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස්කරන ලද හෙයින් වඩා ප්‍රායෝගික ප්‍රශ්න වලින් එය සමන්විත විය. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ඉහළ ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන් තොරතුරු තාක්ෂණයේ ගිණුම්කරණ සහ ව්‍යාපාරික පරිසරයන්හි ප්‍රායෝගික පැතිකඩ හා භාවිත යෙදුම් අලලා වඩාත් දැනුවත්භාවය ලබා ගත යුතුය. මෙම ප්‍රශ්න පත්‍රයට ඉහළ ලකුණු ලබාගැනීමට වැඩ කිරීමෙන් ලබන අත්දැකීම් අත්‍යවශ්‍ය බව මෙහිලා අවධාරණය කරනු ලැබේ.

\- - -

## විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

7. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

8. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක / විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

9. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -